**නීලන් තිරුචෙල්වම් භාරය**

**ව්‍යාපෘති යෝජනා කැඳවීම**

**''තිරසාර සංවර්ධනයට ප්‍රජා සහභාගිත්වය සහ ඉන් ප්‍රතිලාභ ලැබීම සඳහා බලගැන්වීම''**
**යෝජනා කැඳවීම් අංකය:NTT/JUNE/2017/01**

නීලන් තිරුචෙල්වම් භාරය 2017 මැයි අරමුදල් ලබාදීමේ වැඩ සටහන යටතේ ''තිරසාර සංවර්ධනයට ප්‍රජා සහභාගිත්වය සහ ඉන් ප්‍රතිලාභ ලැබීම සඳහා බලගැන්වීම'' ව්‍යාපෘති යෝජනා කැඳවීම් අංකය:**NTT/JUNE/2017/01** සඳහා ව්‍යාපෘති යෝජනා ලබා ගන්නා බව සතුටින් දැනුම් දෙමු.

## පසුබිම

නීලන් තිරුචෙල්වම් භාරය යනු සමාජ සාධාරණත්වය, සාමය සහ ප්‍රතිසන්ධාන මුල පිරුම් සඳහා ආධාර ලබා දෙන ශ්‍රී ලාංකික පුණ්‍යායතනයකි. එය වසර 2001 දී ස්ථාපනය කරන ලද්දේ ශ්‍රී ලාංකික ව්‍යවස්ථාදායකයෙකු, ආණ්ඩුක්‍රම විශාරදයෙකු, සාම වාදියෙකු සහ ආයතන ගොඩ නගන්නෙකු මෙන්ම අවිහිංසාව තුළින් සාමය ගොඩ නැගීමට ක්‍රියාකාරීව දායක වූ ආචාර්ය නීලන් තිරුචෙල්වම් මහතා ඝාතනය කිරීමෙන් පසුවය. මෙම භාරය ආරම්භයේ සිටම මානව අයිතිවාසිකම්, විනිවිද භාවය හා වගවීම පහසුකරණයට දායකවීමෙන් හා බහුවිධතාවය, විවිධත්වය සහ වාර්ගික එකමුතුව ප්‍රවර්ධනය කිරීමෙන් ඔහුගේ උරුමය පුළුල් කිරීමට හා පවත්වා ගැනීමට ප්‍රයත්න දරයි. ඒ අරමුණෙන් නීලන් තිරුචෙල්වම් භාරය ප්‍රදානයන් ලබා දීමෙන් දිවයින පුරා ප්‍රජා මූලික සංවිධානවල හැකියාවන් ශක්තිමත් කරයි. එමෙන්ම සාමය ගොඩ නැගීමේ මාධ්‍යයක් වශයෙන් කලා සහ සංස්කෘතික ක්‍රියාකාරකම්වලට ආධාර ලබා දීමෙන් දීර්ඝ කාලින කීර්තියක් හිමි කර ගෙන ඇත.

## ව්‍යාපෘති යෝජනා කැඳවීමේ අරමුණු

ව්‍යාපෘති යෝජනා කැඳවීමෙන් විශේෂයෙන්ම අදහස් කරනුයේ ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන සමාජ වෙනසක් සඳහා වැඩ කිරීමට සහ ඊට දායකවීමට ජනතාවගේ හැකියාව ශක්තිමත් කිරීමය. එමෙන්ම වෙනස් කොට සැලකීමෙන් හෝ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් (ස්ත්‍රීන්, ළමයින් සහ තරුණයන්, සංක්‍රමණික සේවකයන්, වතු කම්කරුවන් සහ වෙනස් වූ හැකියාවන් ඇති අය වැනි) කොන් කරන ලද ප්‍රජාවන් සහ අවදානමට ලක්ව ඇති කණ්ඩායම් අයිතීන් භාවිතා කරනු සඳහා ශක්තිමත් කිරීමට ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීමද අරමුණු කරයි.

## ව්‍යාපෘති වර්ග

නීලන් තිරුචෙල්වම් භාරය එහි අරමුණුවලට ගැලපෙන, එහි දැක්ම සහ මෙහෙවර වඩාත් ඉදිරියට ගෙන යන සංවිධානයේ අරමුදල් ලබා දීමේ මග පෙන්වීම්වලට අනුකූල සහ සංවිධානයේ උපාය මාර්ගික ක්ෂේත්‍ර එකක හෝ වැඩි ගණනක වැඩ කරන සංවිධානවලට සහාය ලබා දේ.

1) ප්‍රජාතන්ත්‍රවාදය, යහ පාලනය සහ ආයතන ගොඩ නැගීම ප්‍රවර්ධනය,
2) සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය සහ සාක්ෂාත් කර ගැනීම,
3) ස්ත්‍රී අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම,
4) සමාජ පරිණාමයට තරුණයන් සම්බන්ධ කර ගැනීම.

අරමුදල් ලබා දිය හැකි ව්‍යාපෘති/ක්‍රියාකාරකම් වන්නේ පහත සඳහන් වන ඒවා නමුත් ඊට සීමා වන්නේ නැත.

අ) ශ්‍රී ලාංකාවේ සියලු දෙනා ඇතුලත් වූ, අවධානමට ලක් වූ ප්‍රජාව වෙනුවෙන් ආර්ථික අවස්ථාවන් පුළුල් කිරීම
ආ) ස්ත්‍රී පුරුෂ භාවය පදනම් වූ සාධාරණත්වය ස්ත්‍රීන් ගේ සමාන අවස්ථා බාධා කරන ව්‍යුහාත්මක සහ සංස්ථානික සාධකයන් ආමන්ත්‍රණය කිරීම
ඇ) මානව හිමිකම් සහ යුක්තිය
ඈ) ස්ත්‍රී අයිතීන් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම
ඉ) ස්ත්‍රීන්, ළමයින් සහ තරුණයින්ට ප්‍රජා සහ මහජන සේවයේ යෙදීමේ හා නායකත්වය ශක්තිමත් කිරීමේ අවස්ථා ලබා දීම
ඊ) ප්‍රකාශනයේ නිදහස
උ) අධ්‍යාපන අයිතිය
ඌ) ජීවන වෘත්තීන් පුහුණුව සහ ආධාර
එ) නිපුණතා ගොඩ නැගීමේ අවස්ථා
ඒ) සාමය ගොඩ නැගීමේ වැඩ සටහන්, විශේෂයෙන් තරුණ සහභාගිත්වය සහිතව
ඔ) කලාව තුළින් විවේචනාත්මක සිතුම් සහ සමාජ ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම
ඕ) ආබාධිතයන්ගේ අයිතීන් තහවුරු කිරීම, තොරතුරු සහ පහසුකම් ලබා දීම, ඔවුන්ගේ අයිතීන් ගැන දැනුවත් කිරීම, ආබාධයන් සහිත පුද්ගලයන්ට ජීවන මාර්ග පුහුණුව සහ ආධාර ලබා දීම
ක) සංක්‍රමණික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල් වල අයිතීන් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම
ඛ) වතු සේවකයන්ගේ අයිතීන් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම

## සුදුසුකම් නිර්ණායක

ඉහත සඳහන් වැඩ සටහන්වලට ගැලපෙන ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලෙස සුදුසු ආයතනවලට ආරාධනය කරමු. ව්‍යාපෘති භූගෝලීය සීමාවන් නැතිව ඉහතින් සඳහන් කළ ව්‍යාපෘති ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශයක හෝ ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කළ හැකිය. ප්‍රදානය තවත් කෙනෙකුට ලබා දිය නොහැක. යෝජිත ක්‍රියාකාරකම් තුන් වැනි පාර්ශ්වයකට උපකොන්ත්‍රාත් දීමකින් හෝ ප්‍රදානය කිරීමකින් තොරව අයැදුම්කරුවන් විසින්ම ක්‍රියාත්මක කරන බව පැහැදිලිව සඳහන් කළ යුතුය.

එක සංවිධානයකට (තනිවම හෝ තවත් සංවිධානයක් හෝ කීපයක් සමග හවුලේ) ඉදිරිපත් කළ හැක්කේ එක අයැදුම් පතක් පමණි.

- නිසි පරිදි ලියා පදිංචි කළ ප්‍රජා පදනම් සංවිධාන (CBOs) දේශීය රාජ්‍ය නොවන සංවිධාන (NGOs), සහ දේශීය ලාභ නොලබන සංවිධාන වලට අයැදුම් කළ හැකිය.
- පුද්ගල අයැදුම්පත් භාර ගනු නොලැබේ.
- වලංගු ලියා පදිංචියක් නැති සංවිධානවල අයැදුම් පත් භාර ගනු නොලැබේ. (සුවිශේෂී අවස්ථාවක වලංගු ලියා පදිංචියක් ඇති පහසුකාරක සංවිධානයක් සමග හවුලේ ඉදිරිපත් කරන ඇයැදුම් පතක් සලකා බලනු ඇත.) පහසුකාරක සංවිධානය මෙම යෝජනා කැඳවීමේ සියලු නිර්ණායක සපුරා තිබිය යුතුය.
- නීලන් තිරුචෙල්වම් භාරයෙන් දැනට ප්‍රදානයක් ලබා සිටින හවුල්කරුවන් එම ප්‍රදානය අවසන් කරන තෙක් නව ප්‍රදානයක් අයැදුම් නොකළ යුතුය.

- නීලන් තිරුචෙල්වම් භාරය හෝ වෙනත් ප්‍රදානකයෙකු විසින් අරමුදල් ලබා දුන් ව්‍යාපෘතියක සාර්ථක කාර්ය සාධනයක් ඉටු නොකළ සංවිධාන වලට නීලන් තිරුචෙල්වම් භාරයෙන් අරමුදල් ලබා දෙන්නේ නැත.
- මෙම භාරය රජයේ ආයතන හෝ දෙපාර්තමේන්තු ඉදිරිපත් කරන අයැදුම් පත් භාර ගන්නේ නැත. දේශපාලන සම්බන්ධතා ඇති ආයතනවලටද අරමුදල් සපයන්නේ නැත.

## ප්‍රදාන මුදල් ප්‍රමාණ සහ ව්‍යාපෘති කාල සීමාව

අයැදුම් කළ හැකි අවම මුදල් ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් 500,000 ක් සහ උපරිමය රුපියල් 2,000,000 නොඉක්මවිය යුතුය. මෙම භාරයෙන් ඉල්ලුම් කරන උපරිමය ව්‍යාපෘති අය වැයෙන් 80% ක් විය යුතුය. සුවිශේෂී අවස්ථාවක උපරිම ප්‍රමාණයට වඩා කෙරෙන ඉල්ලීම් ගැන සලකා බැලීමේ අයිතිය නීලන් තිරුචෙල්වම් භාරය සතුය. ව්‍යාපෘති කාල සීමාව උපරිම වශයෙන් මාස 18 ක කාල සීමාවක් සහ ව්‍යාපෘති ආරම්භය ඔක්තෝම්බර් 2017 හෝ පසුව විය යුතුය.

## ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ආකාරය

- ඉල්ලුම් පත් පහත සඳහන් වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය http://neelan.org/download-forms/
- ආකෘති පත්‍රිකා ලබා ගැනීමේ දී කිසියම් අපහසුතාවයක් වන්නේ නම්, ආකෘති පත්‍රිකාවක් ලබා ගැනීමට ඉල්ලීමක් grant.applications@neelan.org වෙත එවීමෙන් හෝ සාමාන්‍ය තැපෑලෙන් ලබා ගත හැකිය
- මෙම ව්‍යාපෘති යෝජනා කැඳවීම පිළිබඳ කිසියම් ප්‍රශ්නයක් ඇත්තේ නම් ජුලි 15 2017 දිනට පෙර grant.applications@neelan.org විද්‍යුත් තැපෑලෙන් අමතන්න. දුරකතන පැහැදිලි කිරීම් සඳහා පහසුකම් නොමැත
- සම්පූර්ණ කරන ලද අයැදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ:

  - විද්‍යුත් තැපෑල: grant.applications@neelan.org (විෂය දක්වන කොටසේ **NTT/JUNE/2017/01** *APPLICANTNAME* සඳහන් කරන්න.)

  - සාමාන්‍ය තැපෑල:
    **NTT/JUNE/2017/01** *APPLICANTNAME* සඳහන් කරන්න
    වැඩ සටහන් කළමනාකරු
    නීලන් තිරුචෙල්වම් භාරය
    16/6 ඒ, වෝඩ් පෙදෙස, (මොහිදීන් ටෙරස්)
    කොළඹ 7.

## අයදුම් පත් ඉදිරිපත් කිරීමේ ආකාරය සහ අවසාන දිනය

අයැදුම් පත් **සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසියෙන්** යතුරු ලියනය කර ඉදිරිපත් කළ යුතුය (අත් අකුරෙන් ලියන ලද ඒවා භාර නොගැනේ.) අයදුම් පත් නිරීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද නොවනු සඳහා ඉංග්‍රීසියෙන් එවන්නේනම් වඩාත් පහසුය.

අයැදුම් පත් නිසි ලෙස සම්පූර්ණ කොට එහි සඳහන් වන සියලු ලිපි ලේඛන ඇතුළත් කළ යුතුය. නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද අයැදුම් පත් (අවශ්‍ය කරන ලිපි ලේඛන නැති) සලකා බලන්නේ නැත.

සියලුම අයදුම් පත් **2017 ජූලි 31** හෝ ඊට පෙර එවිය යුතුය. මෙම දිනයට පසුව ලැබෙන අයදුම් පත් ඊළඟ ව්‍යාපෘති කාල සීමාවේ දී සලකා බලනු ඇත.

සියලුම අයදුම්කරුවන් නිල වශයෙන් දැනුම් දෙනු ලබන්නේ **ඔක්තෝම්බර් 2017**. ඉදිරිපත් කරන ලද අයදුම් පත් පිළිබඳව කරුණාකර අපගෙන් විමසීමෙන් වළකින්න.

**නීලන් තිරුචෙල්වම් භාරයේ වැඩ සටහන් කමිටුව ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.**